







# 2013 පෙබරවාරි

දිනපොත

06. ටියුනීසියාවේ විපක්ෂ නායක චොක්රි බිලේඩ් නාඳුනන තුවක්කුකරුවෙකුගේ වෙඩි ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත්වේ.

09. ඉන්දියාවේ පාර්ලිමේන්තුවට 2001 වසරේ දෙසැම්බර් මාසයේ ප්‍රහාරයක් එල්ල කිරීමේ සිදුවීමට වරදකරුවී මරණ දඬුවම නියම නියමව සිටි අෆ්සාල් ගුරුගේ එල්ලා මරාදැමෙයි. ජම්බු කාශ්මීර වැසියකු වූ ඔහු වරදකරු කරමින් ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය මරණ දඬුවම ලබාදුන්නේ 2004 වසරේදීය.

11. අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා ධුරයෙන් ඉල්ලා අස්වෙන බව බෙනඩික් පාප්තුමා නිවේදයන කරයි. 2005 වසරේ පාප් පදවියට පත් එතුමා ධුරයෙන් ඉවත් වූ ප්‍රථම පාප්වහන්සේ ලෙස ඉතිහාසයට එක්වේ.

16. පාකිස්ථානයේ ක්වෙටා නුවර සිදුවූ බෝම්බ පිපිරීමකින් 81දෙනෙකු ජීවිතක්ෂයට පත්වේ. ෂියා මුස්ලිම් බහුතරයක් වෙසෙන ක්වෙටාහි පාසලක් ඉදිරියේ සිදුවූ මේ බෝම්බ ප්‍රහාරයේ වගකීම සුන්නි මුස්ලිම් සංවිධානයක් බාරගනියි.

20. ටියුනීසියා අගමැති හමාඩි ජෙබාලි ධුරයෙන් ඉල්ලා අස්වේ. 2011 වසරේ 'අරාබි වසන්තය' ජනතා නැගිටීම්වලින් බෙන් අලිගේ පාලනය බිඳ වැටීමෙන් පසු බලයට පත් ඉනාඩා නමැති මුස්ලිම් දේශපාලන මණ්ඩලයෙන් අගමැති ධුරයට පත්වූ ජෙබාලි සිදුකිරීමට ගිය දේශපාලන ප්‍රතිසංස්කරණ ජනතාව ප්‍රතික්ශේප කිරීම මේ ඉල්ලා අස්වීමට හේතුවිය.

22. සිරියාවේ ඩැමස්කස් අගනුවර පිහිටි එරට පාලක පක්ෂ මූලස්ථානය ඉදිරිපිට සිදුවූ බෝම්බ පිපිරීමකින් 60දෙනෙකු ජීවිතක්ෂයට පත්වේ.

25. දකුණු කොරියාවේ ජනාධිපති ධුරයට පත් ප්‍රථම කාන්තාව වන පාක් ගුවන් හායි ධුරයේ දිවුරුම් දෙයි. 61හැවිරිදි හායි ජනාධිපතිවරණයෙන් ජයගත්තේ 2012 වසර අවසානයේදීය.

ශ්‍රීලාල් සෙනෙවිරත්න